## බියගම ප්‍රාදේශීය සභාව
## ගම්පහ දිස්ත්‍රික්කය

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 22 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට බියගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ස්ථාවර වත්කම් ගිණුම් තැබීමට අදාලව ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි. ස්ථාවර වත්කමක් ලෙස ගිණුම්ගත කළයුතු අවම වටිනාකමක් හා වත්කමේ ස්වභාවය හා ආයු කාලය අනුව එය ස්ථාවර වත්කමක් වශයෙන් හඳුනා ගැනීමකින් තොරව ඉතා සුළු වටිනාකමක් සහිත හා නැවත විකුණා මුදල් කරගත නොහැකි කෙටි ආයුකාලයක් සහිත අයිතම ස්ථාවර වත්කම් ගිණුමට ඇතුලත් කර තිබුණි.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවන ලද රු.70,604 ක මුද්දර ගාස්තු වියදම පෙර ගෙවුම් ගිණුමට හරකර තිබුණි.

(ආ) පොදු තැන්පත් ගිණුමින් රු.10,000 ක පෙර පාසල් වියදමක් දැරීමේදී පොදු තැන්පත් ගිණුමට දෙවරක් හර කර තිබුණි.

(ඇ) 2014 වර්ෂයට ලැබිය යුතු උපාධිධාරී වැටුප් ප්‍රතිපූර්ණ රු.20,000 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඈ) ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන විශේෂ වැඩසටහන යටතේ වෙනත් ආයතන වලින් ප්‍රතිපූර්ණය විය යුතු අත රැඳවුම් රු.8,698,145 ක් සභාවේ ණයහිමියන් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඉ) සභා අරමුදල් යටතේ ඉදිකිරීම් 9 ක වටිනාකම රු.2,952,573 ක් ප්‍රාග්ධනිතකර නොතිබුණි.

1.3.3 **නොසැසඳුණු ගිණුම්**

ගිණුම් විෂයයන් දෙකක මූල්‍ය ප්‍රකාශන අනුව දක්වා ඇති ශේෂය සහ උපයෝගී ලේඛන හා වාර්තා අනුව ශේෂය අතර රු.616,277 ක වෙනසක් විය.

1.3.4 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**ලැබිය යුතු ගිණුම්**

(අ) 2017 දෙසැම්බර් 31 දිනට රු.13,859,814 ක් වූ හිඟහිටි වෙනත් ආදායම් ශේෂය තුළ හිඟහිටි කර්මාන්ත බදු රු.2,046,730 ක්, හිඟහිටි වෙළඳ බලපත්‍ර රු.1,321,566 ක්, හිඟහිටි වෙළඳස්ථාන කුලී රු.6,472,769 ක් හා

හිඟහිටි බදු කුලී රු.4,012,748 ක් වූ අතර මෙම ශේෂ වලට අදාලව කාලවිශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට මාකොළ උප කාර්යාලයේ ප්‍රචාරණ දැන්වීම් හිඟ ශේෂය රු.552,752 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3.5 **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම.**

උපලේඛන හා සමීක්ෂණ මණ්ඩල වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 204,830,300 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.6 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන වල ඉන්ධන දැවීම පරීක්ෂාකර නොතිබුණි. |
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන කඩ කාමර බදුදීම සඳහා වූ චක්‍රලේඛය | වසර පහකට වරක්වත් තක්සේරුගත බදු කුලිය සංශෝධනය කල යුතු වුවත් කඩවත උප කාර්යාලයට අයත් පොදු වෙළඳ පොළ භූමියේ වෙළඳ සැල් 65 ක් සම්බන්ධයෙන් අවසන් කඩ කුලී තක්සේරුව සිදුකර තිබුණේ 2008 වසරේදීය. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.94,521,293 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.87,204,422 ක් විය.

2.2 **මූල්‍ය පාලනය**

(අ) සභාව සතු මුදල් රුපියල් මිලියන 41.3 ක් වාර්ෂිකව කල්පිරෙන ස්ථාවර තැන්පතු හතක සහ ත්‍රෛමාසිකව කල්පිරෙන ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි.

(ආ) 2015 ජනවාරි බැංකු ප්‍රකාශයට අනුව නිශ්කාෂනය නොවූ රු. 64,732 ක් වටිනා චෙක්පත් 03 ක් 2017 දෙසැම්බර් දක්වාම බැංකු සැසඳුම් ප්‍රකාශයේ ඉදිරියට ගෙන එමින් පැවති අතර නිරවුල් කරගෙන නොතිබුණි.

2.3 **ආදායම් පරිපාලනය**

2.3.1 **ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් සහ හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 වර්ෂය | | | | 2016 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 77,265,163 | 84,112,658 | 87,248,731 | 39,325,980 | 74,793,025 | 85,298,336 | 97,111,116 | 42,085,803 |
| කුලී | 5,058,860 | 4,788,946 | 4,667,968 | 10,485,518 | 4,110,000 | 4,543,531 | 3,969,701 | 10,364,539 |
| බලපත්‍ර ගාස්තු | 1,062,000 | 1,120,183 | 1,149,184 | 1,321,566 | 1,500,000 | 877,754 | 925,204 | 1,350,566 |
| වෙනත් ආදායම් | 233,943,600 | - | 200,343,001 | - | 213,002,800 | - | 232,243,000 | - |

2.3.2 **ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

2017 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟ ආදායම රු.51,333,972 වූ අතර ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.

| | වර්ෂ 1 – 5 ත් අතර | වර්ෂ 5-10 ත් අතර | වර්ෂ 10 ට වැඩි | සමස්ථ හිඟ ආදායම |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 25,185,427 | 17,520,364 | 1,859,565 | 44,565,356 |
| කර්මාන්ත හා ව්‍යාපාර බදු | - | - | 772,200 | 772,200 |
| වෙළඳ ස්ථාන කුලී | 56,900 | 4,321,222 | 1,501,544 | 5,879,666 |
| බදුකර කුලී | - | 116,750 | - | 116,750 |
| | | | | 51,333,972 |

2.3.3 **වරිපනම් හා බදු**

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.19,047,301 ක ආදායම් අඩුවීමක් නිරීක්ෂණය වූ අතර වරිපනම් ඒකක ගණන ඒකක 799 කින් වැඩිවී තිබුණි. සමස්ථ හිඟ ආදායම වූ රුපියල් මිලියන 51 න් සියයට 86 ක් හිඟ වරිපනම් විය. මේ පිළිබඳව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.

2.3.4 **කුලී**

(අ) කඩවත උපකාර්යාලයේ “සී” ගොඩනැගිල්ලේ පිහිටි කඩ කාමර සඳහා 2003 නව තක්සේරුවෙන් පසු කඩහිමියන් විසින් නඩුවක් ගොනුකර තිබූ අතර, වසර 10 කට වඩා වැඩි හිඟ ශේෂය වන රු.3,979,342 මුදලක් කඩහිමියන්ගෙන් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ) කඩවත උප කාර්යාලයට අයත් මාළු වෙළඳසැල් 04 ක 2017 දෙසැම්බර් 31 දිනට වසර 05 ට වැඩි හිඟශේෂය රු. 598,210 ක් විය.

(ඇ) කඩවත උප කාර්යාලයේ A ගොඩනැගිල්ලේ වෙළඳසැල් 09 ක වසර 5 ට වඩා වැඩි හිඟ ශේෂය රු.86,150 ක් වූ අතර වෙනත් පුද්ගලයින් මෙම වෙළඳසැල් පවත්වාගෙන යනු ලබන බැවින් පැරණි හිඟ අයකර ගැනීම සඳහා කටයුතුකර නොතිබුණි.

(ඈ) කඩවත උප කාර්යාලයේ වසර 5 – 10 දක්වා හිඟ කඩකුලී ශේෂය රු. 192,300 ක් වූ අතර මෙම කඩ කාමර දීර්ඝ කාලයක් තිස්සේ වසා තිබුණි.

(ඉ) පොදු වෙළඳසැලේ A ගොඩනැගිල්ල 2018 මැයි 15 දින භෞතික විගණන පරීක්ෂා කිරීමේදී අංක 04,18, 19, 20, 21, 24 , 26, 27, 29, 30, 31, හා 41 කඩ කාමර සම්පූර්ණයෙන්ම වසා තිබුණි.

(ඊ) කඩවත උපකාර්යාලයට අයත් කඩකාමර 77 ක් වසර 5 කට පෙර සිට ගිවිසුම්ගතවීමකින් තොරව කුලියට දී තිබුණි.

2.3.5 <u>වෙනත් ආදායම්</u>

(අ) <u>දැන්වීම් පුවරු</u>

(i) 2017 වාර්ෂික අයවැය ලේඛනය අනුව වර්ෂය තුළදී කඩවත හා මාකොළ උප කාර්යාල බලප්‍රදේශයෙන් අය කිරීමට ඉලක්ක කරතිබූ මුදල රු.240,000 ක් වූ අතර අයකර තිබූ මුදල රු.131,500 ක් විය.

(ii) දැන්වීම් පුවරු ලේඛනයේ නම, දිනය, මුදල, ලදුපත් අංක, නාමපුවරු ප්‍රදර්ශනය කරන ස්ථානය, ස්ථානගත කරන අන්දම ආදී කරුණු ඇතුලත් විධිමත් ලේඛනයක් පිළියෙලකර නොතිබුණි.

(iii) 2015 දෙසැම්බර් 28 දිනැති අංක 1947/16 දරන ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය ප්‍රකාර ප්‍රචාරණ දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව ප්‍රචාරණ දැන්වීම් පුවරු 70 ක් සඳහා රු.552,752 ක ගාස්තු අයකරගෙන නොතිබුණි.

**(ආ) <u>සම්ප්‍රේෂණ කුළුණු</u>**

(i) 2017 දෙසැම්බර් 31 දිනට දුරකථන කුළුණු 04 කින් සභාවට ලැබිය යුතු හිඟ ශේෂය වූ රු.112,941 ක මුදල අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ii) දෙල්ගොඩ උපකාර්යාලයට අයත් බලප්‍රදේශය තුළ සම්ප්‍රේෂණ කුළුණු 32ක් ඇතත් ඒවා පිළිබඳව සමීක්ෂණයක් කර සම්ප්‍රේෂණ කුළුණු හඳුනාගෙන ගාස්තු අයකර නොතිබුණි. සම්ප්‍රේෂණ කුළුණු ස්ථානගත කිරීමේදී එක් කුළුණකින් ව්‍යාපාර බදු අවම වශයෙන් රු.3,000 ක් අයවිය යුතු වුවත් මෙම මුදල් අය නොකිරීම හේතුවෙන් සභාවට අයකරගත හැකිව තිබූ ආදායම අහිමිවී තිබුණි.

2.3.6 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.6,715,693 ක් විය.

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කාර්ය සාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>අතුරු ව්‍යවස්ථා</u>

ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 08 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් 08 ක් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙලකර නොතිබුණි.

(ඇ) <u>අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම</u>

ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ ඇස්තමේන්තු මුදල රු.15,000,000 ක් වූ කාර්යයක් ඉටුකිරීම සඳහා රු.7,000,000 ක මුදලක් වැය කර තිබුනද, අපේක්ෂිත නිමවුම් මට්ටම අත්පත් කරගෙන නොතිබුණි.

(ඈ) <u>ආරම්භ නොකළ කර්තව්‍යයන්</u>

2017 සමාලෝචිත වර්ෂය තුළ විවිධ මූලාශ්‍ර යටතේ ලැබී තිබූ රු.7,720,197 ක් වටිනා ව්‍යාපෘති 15 ක වැඩ ආරම්භකර නොතිබුණි.

(ඉ) <u>ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය</u>

බියගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කසළ කළමනාකරණය වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට රු.28,511,499 ක් වැය කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) වර්ග කිලෝමීටර් 61.1 කින් යුත් බියගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් දිනකට එකතු කරන කසළ ටොන් 45 ක් පමණ දිරන නොදිරන වශයෙන් වෙන්කර ලබාගෙන ඇතත් දෙල්ගොඩ අංගනය තුළ ගොඩගසා තිබුණි.

(ii) කසළ ඉවත් කිරීම වෙනුවෙන් පුද්ගලික ආයතනයකට කසළ ටිපර් රථ 01 ක් සඳහා රු.11,900 ක් ගෙවීමට එකඟවී තිබූ අතර සභා සේවකයින් විසින් දෙල්ගොඩ පිහිටි කසළ හුවමාරු මධ්‍යස්ථානයට එක්රැස් කරන කසළ JCB යන්ත්‍රයක් මගින් ටිපර් රථවලට පටවාදීම වෙනුවෙන් සභාව විසින් දැරූ වියදම රු.422,122 ක් විය. ගිවිසුම අනුව මෙම වියදම අදාළ ආයතනය විසින් දැරිය යුතු වියදමක් විය.

(iii) කසළ අංගනයේ පවත්වාගෙන යන ලේඛනය අනුව සමාලෝචිත වර්ෂය තුල රු.19,718,300 ක මුදලක් අදාළ පුද්ගලික ආයතනයට ගෙවීම් කර ඇති නමුත් බැහැර කරනලද කසළ ප්‍රමාණය පිළිබඳ විස්තර ලේඛනයේ සඳහන්කර නොතිබුණි.

(iv) දෙල්ගොඩ කසළ හුවමාරු මධ්‍යස්ථානය සඳහා පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි.

(v) 2016 මාර්තු 16 දින සිට 2017 මාර්තු 15 දින දක්වා අවසන් බැහැර කරලීම ලබාදී තිබූ ආයතනයටම 2017 මාර්තු 15 සිට දෙසැම්බර් 31 දක්වා කාලයටද ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව කමිටු තීරණයක් මගින් ලබාදී තිබුණි.

(ඊ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යායපත්‍රය පිළිබඳව ප්‍රාදේශීය සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 ජූනි 07 දින වන විටත් සකස්කර නොතිබුණි.

3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

<u>පොදු තැන්පත් ගිණුම</u>

(අ) පොදුතැන්පත් ලේඛනයට ඇතුලත් කළ යුතු සියළු සටහන් ඇතුලත් නොකිරීම හා විවිධ තැන්පත් ගිණුම තුලනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුමෙහි දක්වා තිබූ රු.27,519,237 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පත් ශේෂයේ නිරවද්‍යතාවය විගණනයට තහවුරු කරගැනීමට නොහැකි විය.

(ආ) විගණනයට ලබාදෙන විස්තර අනුව තැන්පත් ශේෂය රු. 30,797,925 ක් විය. මෙම ශේෂය තුල වර්ෂ 02 ත් 05 ත් අතර රු.5,232,932 ක් හා වර්ෂ 5 ට වැඩි රු.12,581,580 ක් විය.

(ඇ) මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු නොකළ වසර 2 කට වඩා වැඩි තැන්පත් එකතුව රු.17,814,512 ක් විය.

3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

(අ) <u>සේවක පුරප්පාඩු හා අතිරික්ත</u>

2017 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

**2017 දෙසැම්බර් 31 දිනට**

| <u>ශ්‍රේණිය</u> | <u>අනුමත</u> | <u>තත්‍ය</u> | <u>පුරප්පාඩු</u> | <u>අතිරික්ත</u> |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 03 | 03 | - | - |
| තෘතීයිය | 01 | 01 | - | - |
| ද්විතියික | 56 | 53 | 05 | 02 |
| ප්‍රාථමික | 134 | 125 | 09 | - |
| | 194 | 182 | 14 | 02 |

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ආදායම් පරීක්ෂක තනතුරු පහක් අනුමත වී තිබුණ ද තනතුරු 4 ක් පුරප්පාඩු පැවතුනි.

(ii) නිලධාරීන් 08 දෙනෙක් ඔවුන් බඳවාගත් ස්ථිර තනතුරු වලට අදාල රාජකාරියෙහි නොයොදවා වෙනත් රාජකාරිවල නිරතකර තිබුණි.

(iii) විශ්‍රාම වැටුප් අහිමි සහා සේවකයින්ගේ අර්ථසාධක දායක මුදල් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු වුවත්, 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා සේව්‍ය හා සේවක දායකත්ව එකතුව රු.239,590 සේවක අර්ථසාධක අරමුදලට බැරකර තිබුණි.

(ආ) <u>සේවක ණය</u>

(i) ස්ථානමාරුවී ගිය සහ වැඩ තහනම් සේවකයින්ගේ වර්ෂ 10 ට වැඩි ණය ශේෂය රු.42,014 ක් සහ සේවය හැරගිය සේවකයින්ගේ වර්ෂ දෙකකට වැඩි ණය ශේෂය රු.66,428 ක් විය.

(ii) 2017 දෙසැම්බර් 31 දින සේවකයින් 11 දෙනෙකුගෙන් වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් අයවීමට ඇති මුදල රු.177,685 ක් විය.

3.4 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**වරිපනම් තක්සේරු කාලානුරූපීව සිදු නොකිරීම.**

1971 අංක 48 පළාත් පාලන ආයතන පිළිබඳ විශේෂ විධිවිධාන පනත අනුව වරිපනම් බදු තක්සේරුව වර්ෂ 05 කට වරක් තක්සේරු දෙපාර්තමේන්තුව ලවා කරවාගතයුතු වුවද අවසන් වරට වරිපනම් තක්සේරුවක් සිදුකර තිබූ 2008 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයටද වරිපනම් අයකර තිබුණි.

3.5 **වත්කම් කළමනාකරණය**

3.5.1 **පවරා නොගත් වත්කම්**

සුසාන භූමි 29 ක් හා ප්‍රජා ශාලා 14 ක් සභාවේ ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත්කර තිබුණත් ඒවා සභාවට පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි.

3.5.2 **නිෂ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්**

2018 මැයි 17 වන විට වසර 05 කට වඩා වැඩි කාලයක සිට භාවිතයට ගත නොහැකි ලෙස දිරාපත්වීමට ඉඩහැර ඇති වාහන 04 ක් තිබුණි.

3.5.3 **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

(අ) ඉඩම් හා ගොඩනැගිලි හා මෝටර් රථ පිළිබඳව සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට පුස්තකාල සමීක්ෂණ වාර්තාව අනුව රු. 43,624 ක් වටිනා පොත් 214 ක් අස්ථානගතවී තිබුණි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

4.1 **අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයට අයවැයගත විෂයයන් 18 යටතේ රු.641,000 ක ඇස්තමේන්තුගත වෙන්කිරීම් සම්පූර්ණයෙන් ඉතිරි වී තිබීම හා වැය විෂයයන් 36 ක රු.50,000 කට වැඩි මුදලක් ඉතිරිවී තිබීම හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙසද යොදාගෙන නොතිබුණි.

4.2 **අභ්‍යන්තර විගණනය**

සභාව තුල අභ්‍යන්තර විගණන නිලධාරීන් සේවයේ යෙදී සිටියද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුන අතර අභ්‍යන්තර විගණන විමසුම් කිසිවක් නිකුත් කල බවට සාක්ෂි නොතිබුණි. 2017 වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර විගණන වැඩ සටහන් පිලියෙළ කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

5 **පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| | -------------- | | ------------- |
| (අ) | ගිණුම්කරණය | (i) | ගිණුම් පොත්පත් හා ලේඛන යාවත්කාලීනව නොපැවැත්වීම. |
| (ආ) | වත්කම් හා දේපළ | (i) | වත්කම් මිලදීගැනීම් ලේඛනවල ඇතුලත් නොකිරීම |
| | | (ii) | භෞතිකව නොමැති වත්කම් ගිණුම් වලින් ඉවත් නොකිරීම |
| | | (iii) | වත්කම් වලට අදාල අයිතිය තහවුරු කිරිමට ඔප්පු හෝ පැවරුම් නියෝග ලබා නොගැනීම |
| | | (iv) | ස්ථාවර වත්කම් ගිණුම් තැබීමේ ප්‍රතිපත්තියක් ඇතිකර නොගැනීම |
| | | (v) | ඉන්වෙන්ටරි ලේඛන පවත්වාගෙන නොයාම |
| | | (vi) | වාර්ෂිකව වත්කම් සමීක්ෂණය නොකිරිම |
| (ඇ) | කොන්ත්‍රාත් පරිපාලනය | (i) | විධිමත් පරිදි ඇස්තමේන්තු හා ගිවිසුම් සකස් නොකිරීම |